# ගෙවත්තේ කිකිළියන් කිහිප දෙනෙක් ඇති කරමු

ඉස්සර වගේ නොවෙයි දැන් නම් ගෘහනියන්ට වී, හාල් වංගෙඩිවල දමාගෙන කොටන්න ඕනෑ නැහැ. මිරිස්, සරක්කු ආදිය ගෙදරදී කුඩු කර ගන්න ඕනෑ නැහැ. මේවා සියල්ලම කරගත්තැහැකි, ලහම තිබෙන මෝලට යැව්වහම. ලහදීම පොල් කිරි ටිකත් බෝතල් වලින ලබා ගන්නට පුළුවන් වෙයිලු. නවීන විද්‍යාව නිසා අපේ ගෘහනියන්ගේ ගෙදර දෙරේ වැඩ කටයුතු පහසුවෙනවාත් සමහම ඉක්මණින් කරන්නටත් පුළුවන් වී තිබෙනවා. මේ නිසා රැකියාවල නොයෙදෙන, ගෙදර දෙර වැඩ කටයුතු කරගෙන ඉන්නා ගෘහනියන්ට විවේකව ගත කිරීමට කාලය දැන් ඉතිරි වී තිබෙනවා. තමන්ගේ විවේක කාලය නිකරුනේ ගත නොකර ගෙදරට අවශ්‍ය බිත්තර සපයා ගැනීමට කිකිළියන් කිහිප දෙනෙක් ඇති කිරීම ඉතාමත් අගෙයි. මේ ගැන ගෘහනියන් බොහෝ දෙනෙක් උනන්දුවක් දක්වනවා. නමුත් ආරම්භ කරන්නේ කොහොමද කියලා දන්නේ නැහැ. මෑතකදී ගෘහනියක් මගෙන් ඇහුවා, "අපේ ගෙදරට අවශ්‍ය බිත්තර ටික ලබා ගන්න කොහොමද කිකිළියෝ කීප දෙනෙක් ඇති කරන්නේ? බලන්න අපේ ගෙදරට දවසකට බිත්තර හයක් ඕනෑ. සත 60 ගණනේ රු. 3.60 ක් යනවා. ඒ අතින් බලනකොට මාසෙකට රු: 100/- කට වඩා යනවා බිත්තරවලට පමණක්. ඉතින් මීට වඩා ලාබෙට බැරිද කිකිළියෝ ඇති කරන්න ගෙදරම?"

මම කිව්වා "තමන්ගේ ගෙදර ප්‍රයෝජනයට අවශ්‍ය බිත්තර කිසිම මුදලක් වැය නොකර, ඒ කියන්නේ නොමිලේම ලබා ගැනීමට ක්‍රමයක් තියෙනවා."


ගෘහනිය "නොමිලේ බිත්තර අපිට දෙන්නේ කවුද?" මම "බිත්තර කවුරුත් නොමිලේ දෙන්නේ නැහැ. තමන්ටම ඒවා නිපදවා ගන්නට පුළුවන්. ගෙදරට දිනකට බිත්තර හයක් අවශ්‍ය නම් කිකිළියෝ 20 දෙනෙක් විතර ඇතිකළහම තමන්ගේ ගෙදර පාවිච්චියට බිත්තර ලබාගෙන වැඩිපුර ඒවා විකුණලා ඒ ලැබෙන මුදලෙන් උන්ට අවශ්‍ය ආහාර ආදිය ලබා ගන්නට පුළුවන්. එයින් ගෙදර ප්‍රයෝජනයට ගන්නා බිත්තර සියල්ලම නොමිලේ ලැබෙනවා."

මේ විදිහට කිකිළියන කීප දෙනෙක් ඇති කිරීමට ලොකු උනන්දුවක් ඇති වුන ඈට මේ ගැන සම්පූර්ණ විස්තරයක් දැන ගන්නට ඕනෑ වුනා. මේ නිසා මම මෙන්න මෙහෙම විස්තර කළා.


කිකිළියන් කීප දෙනෙක් ඉතාම අඩු වියදමකින් ඇති කර ගැනීමට පහසුම ක්‍රමය දිනක් වයසැති තෝරපු කිකිළි පැටවුන් 25 දෙනෙක් ලබාගෙන ඇති කිරීමයි. මේ පැටවුන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් හෝ පුද්ගලික ආයතනයකින් මිළදී ගන්නට පුළුවන්.

මුලින්ම කළයුතුව තිබෙන්නේ පොඩි කුකුල් ගෙයක් හද ගැනීමයි. කිකිළියෝ 20 දෙනෙකුට වර්ග අඩි 60 ක් පමණ ඉඩ කඩ අවශ්‍ය නිසා අඩි 6 ක් පළල අඩි 10 ක් දිග ගෙයක් සෑහෙනවා.

රූප සටහන්වල පෙන්වා දී ඇති පරිදි ගඩොල් නැතිනම් මැටි වලින් බාග බිත්තිත්, ඉතිරි කොටසට අඟල් 1/2 දැල් තහඩුත් ගසා ගේ තනන්න පුළුවන්. වහලෙට පොල් අතු, පිදුරු, ඇස්බෙස්ටොස් හෝ උළු වුනත් පාවිච්චි කරන්න පුළුවන් (1, 2, රූප). මුලින්ම ගෙයි බිමට වියලි දහයියා අඟල් 3 ක් පමණ ඝනවට අතුරලා පැටවුන්ගේ වැඩීමත් සමහ ඝනකම අඟල් 6–7 ක් දක්වා ක්‍රමයෙන් වැඩි කරන්න පුළුවන්.




①




②

කිකිලි පැටවුන් ගන්නට ඉස්සෙල්ලා උපකරණ කීපයක් ලෑස්ති කර ගන්න ඕනෑ. පැටවුන්ට කිකිලිගේ උණුසුම නැති නිසා එය කෘතිම ලෙස ලබා දෙන්නට ඕනෑ. ලන් තැරුමක නැතිනම් විදුලි ලාම්පුවක ආධාර යෙන් මෙය පහසුවෙන් සැපයිය හැකියි. උණුසුම විසිරී නොයා රැකගෙන පැටවුන්ට එයින් උපරිම ප්‍රයෝජනයක් ලබා දීම සඳහා රූප සටහනින් පෙන්වා ඇති පිළිවෙලට බෙලෙක් තහඩු වලින් ආවරණයක් තැනිය




③



④


යුතුයි. මෙය කුකුල් ගෙයි එක් මුල්ලක තබා පැටවුන් උණුසුමෙන් ඈතට දුව යෑම වැළැක්වීමට අඟල් 9 ක් පමණ උස තහඩු වක් තැබිය යුතුයි. (3, 4 රූප). පැටවුන්ට පිරිසිදුව ජලය හා ආහාර සැපයීමට උපකරණ ගෙදරදීම වියදමක් නැතිව සාද ගන්නට පුළු වන් (5, 6, රූප.) බිත්තර දමන කිකිලියන් 20 ක් අවශ්‍ය නම් දිනක් වයසැති පැටවුන් 25 දෙනෙක් ලබා ගත යුතුයි. කිකිලි පැටවුන් ලබා ගත් දිනයේදී ප්‍රථමයෙන්ම කළ යුත්තේ ලන්තැරුම හෝ විදුලි ලාම්පුව දල්වා පැටවුන් තබා මදක් සිසිල් කළ උණු වතුර බීම සඳහා තැබීමයි. දවසක් යනතුරු කුඩා පැටවුන්ට හුනු සහල් වැනි කුඩා කැබැලි සහිත ධාන්‍ය වර්ගයක් දෙන්නට ඕනෑ. ඉන්පසු ආහාර මිශ්‍රනයක් සපයන්න ඕනෑ. සතුන්ට නිදැල් ලේ හැසිරෙමින් ආහාර සොයා ගැනීමට ඉඩ නොලැබෙන නිසා නියම පෝෂ්‍යදයක ආහාර ලබා දීම ඉතා අවශ්‍යයි. මේ නිසා පැටවුන්ට මාස දෙකක් වයස් ගත වනතුරු 'චික්මෑෂ්' නැමැති කුඩා පැටවුන්ට දෙන විශේෂ කුකුල් ආහාර මිශ්‍රණය දිය යුතුයි. මාස දෙකේ සිට බිත්තර දමන අවධිය තෙක් 'ග්‍රෝවස් මෑෂ්' නැමැති හැදෙන පැටවුන්ට දෙන ආහාර මිශ්‍රණයත්, ඊට පසු 'ලේයස් මෑෂ්' නැමැති බිත්තර දමන කිකිලියන්ට දෙන මිශ්‍රනයත් දෙන්නට ඕනෑ.

පැටවුන්ට කුඩා කාලයේදී වැළඳෙන මාරාන්තික රෝගයක් නම් ''කොක්සිඩියෝසිස්'' රෝගයයි. මෙයින් වැලකීම සඳහා පැටවුන්ට සතියක් ගත වනවිට කොක්සිඩියෝසිස් රෝග



ආහාරයට

(5)



ජලයට

(6)

නිවාරක බේතක් වෙළඳපොලෙන් ලබාගෙන දිය යුතුයි.

කුකුල් වසූරිය හා රනිකට් යන රෝග වැළැක්වීම සඳහාත් එන්නත් කිරීම ඉතා වැදගත්. මේ එන්නත් කිරීම නොමිලේම කරගත හැකියි, පළාතේ පශු වෛද්‍ය නිල ධාරී මගින්.

ආහාර මිශ්‍රණයට අමතර වශයෙන් පැටවුන් හැදීගෙන එන කාලයේදී තණකොල, කන් කුන්, මුකුණුවැන්න ආදී පලා වර්ග දීම වැද ගත්. මේවා කපා කුඩුවට දැමිය යුතුයි. ඉඩ කඩ ඇති නම් දිනකට පැය දෙකක් පමණ නිදැල්ලේ හැසිරීමට ඉඩ දීම වඩාත් පහසුයි.

කුකුල් ගේ දමා ඇති දහයියා නිතරම මිශ්‍ර කරමින් වියලිව තබා ගැනීම, වතුර හා ආහාර භාජන ඉතා පිරිසිදුව තබා ගැනීම, කිසියම් රෝග ලක්ෂණයක් දුටු වහාම රෝගී සතා වෙන් කිරීම සිතේ තබා ගත යුතු වැද ගත් කරුණුයි.

වර්ගය හා වැඩීම අනුව මාස 4–6 වයස් වනවිට බිත්තර දැමීම ආරම්භ කරනවා. පැටවුන් 25 දෙනාගෙන් 5 දෙනෙක් මිය ගියත් බිත්තර දමන කිකිලියන් 20 දෙනෙක් ඉතිරි වන නිසා හොඳට බිත්තර දමන කාල යේදී දිනකට බිත්තර 15–17 ක් ලැබෙන්නට ඕනෑ. මෙයින් බිත්තර 6 ක් ගෙදර ප්‍රයෝජනයට ගත්තහම විකිණීම සඳහා බිත්තර 10ක් වත් තිබෙනවා. සත 60 ගණනේ වික්කත් දිනකට රු. තුනක ආදයමක් තිබෙනවා. කිකිලියන් 20 දෙනාට ආහාර සැපයීමට දින කට රු. 3/– ක් අවශ්‍ය නැහැ. එමනිසා ගෙදරට අවශ්‍ය බිත්තරත් නොමිලේම ලබා ගෙන තව ලාබෙකුත් ඉතිරි වෙනවා.